Department of Education,Sabaragamuwa Province/ Weekly School

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව - සති පාසල

**ශ්‍රේණිය - 10 (I වාරය)** | **විෂය - චිත්‍ර කලාව** | **සතිය - මාර්තු 02**

01) පාඩම හෝ ඒකකය - 7.1.2. ලංකාතිලක විහාරය

02) ඉගෙනුම් ඵල -

- ලංකාතිලක විහාරයේ ගෘහ නිර්මාණ, මූර්ති, කැටයම්, සිතුවම් නම් කරයි.
- ලංකාතිලක විහාරයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ලංකාතිලක විහාරයේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

03) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

- ලංකාතිලක විහාරය හා සබැඳි වර්ණ ඡායාරූප සී.ඩී. තැටි, ගඩලාදෙණි විහාරය සිතුවම් හා කැටයම් සහිත පින්තූර නරඹන්න.
- ලංකාතිලක විහාරය පිළිබඳ පෙර දැනුම ආවර්ජනය කර ගන්න.
- ලංකාතිලක විහාරය පිළිබඳ වැඩිදුරටත් තොරතුරු එක් රැස් කරන්න.
- පහත ලබා දී ඇති කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කර ඒ ඇසුරෙන් කාර්ය පත්‍රිකාවේ ඇති ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- පාසල ආරම්භ වූ පසු ඔබගේ අනාවරණය පන්ති කාමරයේ ඉදිරිපත් කරන්න.

**<u>කාර්ය පත්‍රිකාව</u>**

1) ලංකාතිලක විහාරයේ දැකිය හැකි වාස්තු විද්‍යා අංග, චිත්‍ර හා මූර්ති නම් කරන්න.

2) ලංකාතිලක විහාරයේ ඓතිහාසික පසුබිම වරහන් තුළ ඇති අනු කොටස් යොදා ගනිමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (යුගය/කාලය, අනුග්‍රහය, ශිල්පියා)

3) ලංකාතිලක විහාරයේ වාස්තු විද්‍යා නිර්මාණවල කලාත්මක ශෛලිය සඳහා පදනම් වූ වරහන් තුළ ඇති අනු කොටස් යොදා ගනිමින් විස්තර කරන්න. (සම්ප්‍රදාය, වාස්තු විද්‍යාත්මක ප්‍රවේශ/සැලසුම්/ ආකෘති, මාධ්‍ය, ශිල්ප ක්‍රම)

4) ලංකාතිලක විහාරයේ බුදු පිළිමය පිළිබඳ වරහන් තුළ ඇති අනු කොටස් යොදා ගනිමින් කලාත්මක ඇගයීමක් කරන්න. (මුද්‍රා, ආසන ක්‍රමය, සිවුර, මුහුණේ ප්‍රකාශනය)

05) ලංකාතිලක විහාරයේ සිතුවම් අතර දක්නට ලැබෙන සිතුවම් නම් කරමින් ඒවා පිළිබඳ ඇගයීමක්

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක -

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - Course : 10 ශ්‍රේණිය චිත්‍ර කලාව - https://www.enenapiyasa.lk
- ගුරු ගෙදර - නැත
- වෙනත් - (YouTube) - https://youtu.be/TbqQ9mqx0dA
  https://youtu.be/PT0Ad4Df-jo
  https://youtu.be/V-f3r2F7iEQ
  https://youtu.be/ypUc-59Xht0
  https://youtu.be/HjO9qF22qtw
- කියවීම් පත්‍රිකාව -

– ගම්පොළ යුගයේ ඉදිවූ ලංකාතිලක විහාරය පැන්හල්ගල නම් වූ ගල්තලාවක් මත ඉදිකර ඇත.

– හතර වන බුවනෙකබාහු රජ කාලයට (ක්‍රි.ව. 1341 - 1351) අයත් මෙම ගොඩනැගිල්ල සේනාධිලංකාර අමාත්‍යවරයාගේ උපදෙස් මත නිර්මාණය කරන ලද්දකි. මෙහි නිර්මාණ ශිල්පියා වන්නේ ඉන්දියාවේ ස්ථපතිරායර් නම් ශිල්පියා යි.

– මෙම ගෘහ නිර්මාණය සඳහා ගඩොල් සහ හුණු බදාම යොදාගෙන ඇති අතර අතීතයේ දී එය මහල් 4කින් යුක්ත විය. පිටත බිත්තියේ නිර්මාණය කරන ලද ඇත් රූප හා පැන්නුම් කුලුනු විහාරයට අලංකාරයක් ගෙන දෙන වාස්තු විද්‍යාත්මක අංග වේ. ප්‍රතිමා ගෘහයට සම්බන්ධ කර සතර දිසාවේ සමන්, විභීෂණ, උපුල්වන් කතරගම හා ගණදෙවියන් උදෙසා සාදන ලද දේවාල පහක් දක්නට ලැබේ.

  ✓ **බුද්ධ ප්‍රතිමා** - ප්‍රතිමා ගෘහයේ ඇති හිඳි බුද්ධ ප්‍රතිමාවේ දෙනෙත් විවෘත ව මෙන් ම, චීවරයේ රැළි තරංගාකාරව යොදමින් බුදුන් වහන්සේගේ අධ්‍යාත්මික ගුණ සමුදායට වඩා බාහිර ලක්ෂණ පෙන්වීමට ශිල්පියා උත්සාහ ගෙන ඇත. එසේ ම වීරාසන ක්‍රමයට වැඩහිඳියි.

  ✓ **සිතුවම්** - මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදායට නෑකම් කියන ලංකාතිලක විහාර සිතුවම් අතර සූවිසි විවරණය, සොළොස්මස්ථානය, සත් සතිය ආදී සිතුවම් වැදගත් ස්ථානයක් ගනියි. එසේ ම කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා සේනාධිලංකාර අමාත්‍ය රූ චිත්‍රණය කර තිබීම දැකිය හැකි ය.

05) අතිරේක පොත්/සඟරා -

- 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- චිත්‍ර කලාව - රුවන්ති කුරේ
- චිත්‍ර කලා ඉතිහාසය - තිලකරත්න දිගන්වෙල


**සැකසුම - නම - කේ.කේ.කේ.එච්.එච්.එච්. පොල්වත්ත.**

**අධ්‍යාපන ආයතනය - කෑ/දෙහි/ නක්කාවිට ක.වි.**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**